# ආලය සඳහා පදනම් වන ආලය විඥානය

- උපශාලාධිපති කරපික්කඩ සෝභිත හිමි

## හැඳින්වීම

මූලික සූත්‍රාගත දේශනාවන් පිළිබඳ විමසා බැලීමේදී සත්වයා සසර තුළ දීර්ඝ කාලයක් දුක් අනුභව කරමින් පැමිණෙන බව පෙන්වා දී ඇත. මෙසේ පුද්ගලයා නිරන්තරයෙන් දුක් අනුභව කිරීමට හේතුව ඇලීම හෙවත් බාහිර ආරම්මණයන් දැඩිව ග්‍රහණය කර ගැනීමයි. ''යම් පුද්ගලයෙකු ඇසින් රූපයක් දැක ප්‍රිය සහගත රූපයෙහි ඇලෙයි. අප්‍රිය සහගත රූපයෙහි ගැටෙයි. නො එළඹි සිහියෙන්, පටු වූ සිතින් වසයි. පවිටු වූ අකුශල ධර්මයන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණයෙන් ලබන චේතො විමුක්තිය හා පඤ්ඤා විමුක්තිය ඇති සැටියෙන් නොදකියි. ඔහු මෙසේ එකඟතා හා විරුද්ධතාවන්ට පැමිණ සුඛ, දුක්ඛ හා අදුක්ඛමසුඛ වූ යම්කිසි වින්දනයක් විඳින්නේ නම් එහි විශේෂයෙන් සතුටු වෙයි. අභිවාදනය කරයි. සතු කර ගනියි. වින්දනය පිළිබඳ එසේ ගන්නා කල්හි සතුට උපදියි. යම් වින්දනයක් පිළිබඳ සතුටු වේ. අභිවාදනය කරයි. නතු කර ගනියි. වින්දනය පිළිබඳ එසේ ගන්නා කල්හි සතුට උපදියි.'' යනුවෙන් මෙම කාරණාව ම.නි. මහාතණ්හාසංඛය සූත්‍රය තුළ විග්‍රහ වේ. එසේ ම මෙම ඇලීම පුද්ගලයා තුළ තෘෂ්ණාව වර්ධනය සඳහා ද බලපානු ලබයි. (උපාදානීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති.) මෙසේ තෘෂ්ණාවත් ඒ තුළින් භවයත් නිර්මාණය වන්නා වූ උපාදානය හෙවත් ආලය පිළිබඳ මූලික සූත්‍රාගතය තුළ දීර්ඝ විවරණයක් දක්නට ලැබේ. නමුත් එම



උපාදානයන් සසර පුරාවට ගමන් කිරීමේ ක්‍රමය පිළිබඳ මූලික සූත්‍ර දේශනා තුළ දක්නට ලැබෙන්නේ අල්ප වශයෙනි. මේ පිළිබඳ සෘජු පැහැදිලි කිරීමක් යෝගාචාර දර්ශනයේ "ආලය විඥානය" තුළින් දැකගත හැකි ය. මෙම ලිපිය තුළින් මූලික සූත්‍රාගත ඇලීමේ ක්‍රියාවලිය මෙන්ම, යෝගාචාර දර්ශනය තුළ දැක්වෙන ආලය විඥානය පදනම්ව එය සංවර්ධනය වන ආකාරය පිළිබඳ විග්‍රහයක් සිදු කරනු ලබයි.

## ආලය පිළිබඳ මූලික සූත්‍රාගත ඉගැන්වීම්

"ආලය" යන්නෙහි අර්ථය ඇලීමයි. මෙය මානසිකත්වය මූලික කොටගෙන සිදු වන්නා වූ ක්‍රියාදාමයකි. මේ පිළිබඳ ආදි බෞද්ධ ඉගැන්වීම් විමසීමේදී ද "ආලය" යන පදය තුළින් මානසිකත්වය මත ක්ලේෂ ග්‍රහණය අර්ථවත් කොට ඇත. ම.නි. අරියපරියේසන සූත්‍රයෙහි බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු තමා අවබෝධ කොට ගත් ගැඹුරු ධර්මය දේශනා කිරීමට මැලි බවක් දක්වා ඇති අයුරු සඳහන් වේ. එයට හේතුව ලෙස දක්වා ඇත්තේ පඤ්චකාම ගුණය රමණය කරන, ආලයන්හි යෙදුණු සත්වයන්ට ගැඹුරු ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය අවබෝධ කිරීමට අපහසු බැවිනි.

''තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි අධිගතො කොම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිත වෙදනීයො ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසමුදිතා ආලයරමා ඛො පනායං පජාය ආලයරතාය ආලයසමුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉධප්පච්චයතා පටිච්චසමුප්පාදො''[1]

මෙහිදී පඤ්චකාම ගුණයෙහි ඇලීම, ඉන් රමණය වීම යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා ආලය යන්න භාවිත කොට ඇති අයුරු දක්නට ඇත. එසේම සං.නි. ආයාචනා සූත්‍රයෙහි ද පඤ්චකාම ගුණයන්හි ඇලීම, ඉන් සංතෘප්තියට පැමිණීම ආලය යන්න තුළින් විග්‍රහ කොට ඇත.

ආලයරාමා බො පනායං පජා ආලයරතා ආලයසමුදිතා ආලයරාමාය බො පන පජාය ආලයරතාය ආලයසමුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්ප ච්චයතා පටිච්චසමුප්පාදො.[2]

ම.නි. චූලසීහනාද සූත්‍රය තුළද ආලය යන පදය තුළින් භව සහ විභව යන දෘෂ්ඨීන්ගේ ඇලීම හෙවත් උපාදානය සංකේතවත් කොට ඇත. එහි දී යමෙක් උක්ත දෘෂ්ඨීන්ගේ සමුදයත්, අස්තන්ගමයත්, ආස්වාදයත් ආදීනවයත් තතු සේ නොදනී නම් සසරින් නොමිදෙන බව දක්වා ඇත.

"ද්වෙ මෙ භික්ඛවෙ දිට්ඨියො භවදිට්ඨි ච විභවදිට්ඨි ච යෙ බො භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා භවදිට්ඨිං අල්ලීනා භවදිට්ඨිං උපාගතා භවදිට්ඨිං අජ්ඣොසිතා විභවදිට්ඨියා තෙ පටිවිරුද්ධා යෙ කෙචි භික්ඛවෙ සමණාවා බ්‍රාහ්මණා වා විභවදිට්ඨිං අල්ලීනා විභවදිට්ඨිං උපාගතා විභවදිට්ඨිං අජ්ඣොසිතා භවදිට්ඨියා තෙ පටිවිරුද්ධා...."[3]

එසේම "ආලය" යන පදයෙහි විරුද්ධාර්ථය "අනාලය" යන්නයි. ආදි බුදු දහමේ "අනාලය" යන පදය ද යෙදී ඇති අවස්ථා තුළ අර්ථවත් වී ඇත්තේ ඇලීම හෙවත් ක්ලේශ ග්‍රහණයන්ගෙන් විනිර්මුක්ත වීමයි. සං.නි. ධම්මචක්කපවත්තන සූත්‍රයේ දුක්ඛනිරෝධ සත්‍යය විස්තර කිරීමේදී කාම, භව, විභව යන තෘෂ්ණාවන්හි නො ඇලීම අනාලය යන්නෙන් විස්තර කොට ඇත.

ඉදං බො පන භික්ඛවේ දුක්ඛනිරොධං අරියසච්චං යො තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො.[4]

සං.නි. සම්මාදිට්ඨි සූත්‍රයේ අනාලය යන්න තෘෂ්ණාවන්හි නො ඇලීම සඳහාත්,[5] සං.නි. අනාලය සූත්‍රයේ එය කාමය තුළ නො ඇලීම යන්න සඳහාත්[6] භාවිත කොට තිබේ.

මීට අමතරව මෙම පදය සං.නි. භාර සූත්‍රයෙහි ද, ඛු.නි. ජාතකට්ඨකතාවෙහි ද, අභිධර්ම පිටකයෙහි විභංග මූලටීකාවෙහි



ද, අභිධම්මාවතාර ටීකාවෙහි ද හමුවන අතර, එම සියලු අවස්ථාවන්හි "තෘෂ්ණාවෙන් මිදීම" යන්න අර්ථවත් කොට ඇත.

මහාවිහාරික ආභිධම්මික සම්ප්‍රදාය විසින් ආලය යන්න ඥාන විභාගාත්මක උපන්‍යාසයකින් සළකා බැලූ අයුරු සංයුක්තනිකායට්ඨකතාවෙන් පැහැදිලි වේ. සංයුක්තනිකායට්ඨකතාවෙහි "ලී" නම් ඇලීමේ ධාතුවට "ආ" උපසර්ගය එකතුවීමෙන් "ආලය" යන්න නිෂ්පන්න වූ බව සඳහන් කරයි. "ආලයරාමාති පංචකාම ගුණෙසු අල්ලීයන්ති"[7] අංගුත්තරනිකායට්ඨකතාව හෙවත් මනෝරථපූරණියෙහි ද ආලය යන්නෙන් පඤ්චකාම ගුණයන් අදහස් කොට තිබේ. "අල්ලයීතබ්බට්ඨෙන ආලයොති පඤ්චකාම ගුණා"[8] එසේම සුත්තනිපාතට්ඨකතාව ආලය යන්න තණ්හා, දිට්ඨි වශයෙන් බෙදා දක්වා ඇත. මෙසේ ථේරීය අට්ඨකතා යුගයෙහි "ආලය" යන සූත්‍රාගත පාරිභාෂික පදය ඥානවිභාගාත්මක පදනමකින් විග්‍රහ කොට ඇති අයුරු දක්නට ඇත. ඒ තුළින් ඔවුන් අර්ථවත් කොට ඇත්තේ පඤ්චකාම ගුණයන්හි ඇලීමයි.

මූලික සූත්‍රදේශනා පිළිබඳ විමසීමේ දී ආලය යන පදයේ අර්ථය වන අල්වාගැනීම යන්නෙහි ගැඹුරු අවස්ථාවක් ලෙස "උපාදාන" යන්න දැක්වේ. මේ තුළින් අර්ථවත් වන්නේ දැඩිව ග්‍රහනය කර ගැනීමයි. එසේ දැඩිව ග්‍රහනය කරගනු ලබන්නේ පඤ්චකාම ගුණයන්ය. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු භුක්ති විඳීමේ කැමැත්ත තුළ පහළ වන්නා වූ තණ්හා උපාදානය සත්වයා භවයෙන් ඉවතට යා නොහැකි අයුරින් රැහැනක් සේ සසර තුළ බැඳ තබයි. මෙම උපාදානය සිව්වැදෑරුම් බව දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි පෙන්වා දී තිබේ.[9]

1. කාම උපාදාන
2. දිට්ඨි උපාදාන
3. සීලබ්බත උපාදාන
4. අත්තවාද උපාදාන යනුවෙනි.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
22 FEB 2016
පුස්තකාලය

"කාම උපාදාන" යනු තමන් ප්‍රිය කරන උපභෝග පරිභෝග වස්තූන් පිළිබඳව ඇති දැඩි ආශාවයි. හෙවත් පඤ්චකාමයේ දැඩිව ඇලීමයි. "පඤ්චඋපාදානක්ඛන්ධ" යනුවෙන් දක්වෙන්නේ මෙයයි. "දිට්ඨිඋපාදාන" යනු නොයෙකුත් දෘෂ්ටීන් දැඩිව අල්වා ගැනීමයි.

"ඉදමෙව සච්චං මොසමඤ්ඤං මය්හං සච්චං තුය්හං මුසා...."[10] යනුවෙන් තම දෘෂ්ටියම සත්‍යය, අනෙක් සියල්ල අසත්‍ය යැයි කල්පනා කිරීමයි. දී.නි. බ්‍රහ්මජාල සූත්‍රයට අනුව මෙබඳු දෘෂ්ටීන් දෙසැටක් පිළිබඳව දක්වේ. එසේම ආත්මය මූලික වූ මෙම දෘෂ්ටිග්‍රහණය ද බුදුසමයට අනුව පඤ්චඋපාදානයම පදනම්ව සිදුවන බව දක්වේ.

"යෙහි කොචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා අනෙක විහිතං අත්තානං සමනුපස්සමානා සමනුපස්සන්ති සබ්බෙ තෙ පඤ්චුපාදානක්ඛන්ධෙ සමනුපස්සන්ති එතෙසං වා අඤ්ඤතරංවා..."[11]

"සීලබ්බත උපාදාන" යනු සීලයෙන් හා ව්‍රතයෙන් සසර පිරිසිදු වේ යැයි දැඩිව පිළිගැනීමයි. අජව්‍රත, ගෝව්‍රත ආදී සීලව්‍රත සමාදානයෙන් හා ශරීරයට දැඩි දුක් දීමෙන්, තිරිසන් සතුන් මෙන් හැසිරීම තුළින් සත්වයා පිරිසිදු වන්නේය යැයි සිතා මෙය දැඩිව ගෙන ක්‍රියා කිරීමයි. "අත්තවාද උපාදාන" යනු ආත්මය දැඩිව අල්ලා ගැනීමයි. එනම් ස්කන්ධ ධර්මයෝ මමය, මාගේය යැයි කල්පනා කිරීමයි.

මෙම සිව්වැදෑරුම් උපාදානයෝ තෘෂ්ණාව ප්‍රත්‍ය කොටගෙනම උපදියි. මෙම උපාදානය පිළිබඳව ඉතා වැදගත් දේශනාවක් සංයුක්ත නිකායෙහි දක්වේ. එනම්, වච්ඡගොත්ත සූත්‍රයයි. එහි දී වච්ඡගොත්ත බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසයි.

"යස්මිං ච පන භො ගොතම සමයෙ ඉමඤ්ච කායං නික්ඛිපති. සත්තො ච අඤ්ඤතරං කායං අනුප්පත්තො හොති. ඉමස්ස පන භවං ගොතමො කිං උපාදානස්මිං පඤ්ඤාපෙති."[12]



(භවත් ගෞතමයන් වහන්ස, සත්වයා මේ භවයෙන් චුත වූයේ වෙයි. අනෙක් භවයකට නොපැමිණියේ ද වෙයි. එහිලා භවත් ගෞතමයන් වහන්සේ කුමක් උපාදාන කොට දක්වන්නේද?)

මෙහි දී වච්ඡගොත්ත බුදුරජාණන් වහන්සේගෙන් විමසන ලද්දේ, එක් භවයකින් චුත වන පුද්ගලයා දෙවන භවයේ ප්‍රතිසන්ධිය ලබන තුරු සිටින්නේ කොතැනකද කියා ය. එම ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ මෙසේ පිළිතුරු ලබා දෙයි.

"යස්මිං ඛො වච්ඡ, සමයෙ ඉමඤ්ච කායං නික්ඛිපති පත්තො ච අඤ්ඤතරං කායං අනුප්පත්තො හොති. තමහං තණ්හුපාදානං වදාමි තණ්හාසමඩගිස්ස වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොතී ති..."[13]

(වච්ඡගොත්ත, සත්වයා මේ භවයෙන් චුත වූයේ වෙයි. අනෙක් භවයට නොපැමිණියේ වෙයි. එහිලා තණ්හා උපාදානය කොට සිටී.)

මෙම දේශනාව තුළින් උපාදානය යන්න පැහැදිලිව තේරුම් ගත හැකි අතර එය භවයට හේතුව ද වෙයි.

## ආලයෙහි ක්‍රියාවලිය

පුද්ගලය සන්තානයෙහි නිර්මාණය වන්නා වූ ඇලීම සිදු වන්නේ ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය තුළිනි. මේ පිළිබඳ පැහැදිලි විග්‍රහයක් ම.නි. මධුපිණ්ඩික සූත්‍රයෙහි හමුවේ.[14] එසේම එම ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය සඳහා මූලික වශයෙන් සම්පූර්ණ විය යුතු කරුණු කීපයක් ද ම.නි. මහාතණ්හාසංඛය සූත්‍රය තුළ දක්වේ. එනම්,

"අජ්ඣත්තිකඤ්චෙ ච චක්ඛුං අපරිභින්නං හොති. බාහිරා ච රූපා ආපාථං ආගච්ඡන්ති තජ්ජොව සමන්නාහාරො හොති. එවං තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති."[15]

1. අවිකල වූ ඉඳුරන් තිබීම.
2. බාහිර අරමුණු ඉඳුරන්ට විෂය වීම.
3. අරමුණු පිළිබඳ මානසික අවධානය යොමු වීම.

මෙහි අවිකල වූ ඉඳුරන් යනු, චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, මන යන ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරීත්වයයි. බාහිර අරමුණු විෂය වීම යනු රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම යන විෂයයන් ඉඳුරන් හා ගැටීමයි. එසේම ඒ පිළිබඳ විඥානයේ හෙවත් මනසේ අවධානය ද තිබිය යුතුය. එය තජ්ජසමන්නාහාරය නම් වේ.[16]

මෙසේ කරුණු සම්පූර්ණ වීමෙන් ඉන්ද්‍රියක්‍රියාවලිය ආරම්භ වන අතර, මෙහි දී පුද්ගලයා ලබන ඥානය සංවර්ධිත තත්වයක් නොවේ. එය නිර්විකල්පිත වූ අවස්ථාවකි. මෙයින් අනතුරුව ක්‍රමයෙන් ඉතා ගැඹුරු වූ මානසික අවස්ථාවක් දක්වා ඉන්ද්‍රිය ඥානය ගොඩනැඟේ. ඒ පිළිබඳව ම.නි. මධුපිණ්ඩික සූත්‍රයේ විවරණය මෙසේ දක්වේ.

''චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වෙදනා. යං වෙදෙති තං සංජානාති. යං සංජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. තතො නිදානං පුරිසො පපංඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු''

''චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං''

අරමුණු ගන්නා ඉන්ද්‍රියන්ට අනුරූපව කිසියම් රූපයකි, ශබ්දයකි, ගන්ධයකි, රසයකි, ස්පර්ශයකි ආදී වශයෙන් ඇති වන මූලික දැනීම මෙම අවස්ථාවෙන් ප්‍රකාශ වේ. මෙය නිර්විකල්පික වූ කිසිදු අත්දැකීමකට පත් නො වූ අවස්ථාවකි.

''තිණ්ණං සංගති ඵස්සො''



ඉන්ද්‍රියේත් අරමුණේත් විඤ්ඤාණයේත් එකතුව ඵස්ස නම් වේ. මෙය චෛතසික ධර්මයක් ලෙස ථෙරවාද අභිධර්මයෙහි පෙන්වා දී ඇත. එසේම මෙය දුකෙහි හටගැනීමටත්, පුද්ගලයාගේ සසර පැවැත්මටත් උපනිශ්‍රය වන අතර, සියලු කර්මයන්ගේ ප්‍රභවයට හේතු කාරකය ද වේ. ''කතමො ච භික්ඛවෙ කම්මානං නිදාන සම්භවො ඵස්සො භික්ඛවෙ කම්මානං නිදාන සම්භවො''[17]

''ඵස්ස පච්චයා වේදනා''

ස්පර්ශය පදනම් කොටගෙන වේදනාව හෙවත් වින්දනය ඇති වේ. මෙය සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යනුවෙන් තුන් ආකාර වේ. මෙම සියලු වේදනාවන් ස්පර්ශය ප්‍රත්‍යකොටගෙනම නිර්මාණය වන බැවින්, ඒවා සියල්ල දුක්ඛ සංඛ්‍යාවට ඇතුළත් වේ. ''වුත්තං ඛො පනෙතං මයා යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති''[18]

''යං වේදෙති තං සංජානාති''

විින්දනය ප්‍රත්‍යකොටගෙන සංජානනය හෙවත් සංඥා නිර්මාණය වේ. පුද්ගලයා මෙහිදී සංඥා නිර්මාණය කර ගැනීම සඳහා තම අත්දැකීම් ප්‍රත්‍යකොට ගනී. එසේම ඔහු ලබන්නා වූ සංඥාව ද නිවැරදි වූ සංඥාවක් නොවේ. ඒ සඳහා මූලික වන කරුණු 2 ක් බුදුසමය තුළ පෙන්වා දී ඇත.

* පුද්ගල ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය සීමා සහිත වීම.
* ඡන්ද, රාගාදි මනෝධර්ම වලින් ප්‍රේරණය වූ සිතකින් බාහිර අරමුණු දෙස බැලීම.

මෙසේ වේදනාව දක්වා වූ ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය තුළ නිෂ්ප්‍රපඤ්චයන් අර්ථවත් වන අතර, මෙම සංඥාවන් නිර්මාණය තුළ පුද්ගල සන්තානයේ ප්‍රපඤ්චකරණය නිර්මාණය වීම ආරම්භ වේ. සුත්ත නිපාතයේ මෙම සංඥාව ප්‍රපඤ්චකරණයේ මූලහේතුව ලෙස දක්වා ඇත.

22 FEB 2016

''මූලං පපංචසංඛාය මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ''[19]

"යං සංජානාති තං විතක්කෙති"

සංඥාව හෙවත් හඳුනාගැනීම පදනම්කොටගෙන විතර්කය නිර්මාණය වේ. මෙය කුසල පක්‍ෂයේත් අකුසල පක්‍ෂයේත් ක්‍රියාත්මක වේ. අකුසල පක්‍ෂය තුළ කාම, ව්‍යාපාද, විහිංසා විතර්කයනුත්, කුසල පක්‍ෂය තුළ නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා විතර්කයනුත් නිර්මාණය වේ. මෙහි දී අකුසල විතර්කයන් තුළ නිරන්තරයෙන් ඡන්ද, දෝස, මෝහ යන මනෝධර්මයන් යුක්ත වේ.

"ඉධ භික්ඛවෙ භික්ඛුනො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො උප්පජ්ජන්ති පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි..."[20]

එම නිසාම මනස ඉබාගාතේ හැසිරෙන අතර, මේ තුළින් ප්‍රපංචකරණය හා ඇලීම සිදු වේ.

"යං විතක්කෙති තං පපඤ්චෙති"

විතර්කයෙන් අනතුරුව මනස තුළ ප්‍රපංච නිර්මාණය වේ. ප්‍රපංච යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඉන්ද්‍රිය ඥානය අනුව ගොඩනැගෙන ඉතා ගැඹුරු මානසික අවස්ථාවකි. මෙම අවස්ථාව තුළ අරමුණු පිළිබඳ දැඩි සේ පැතිරීමක්, ව්‍යාප්තියක්, ග්‍රහණය කර ගැනීමක් සිදු වේ. මජ්ඣිමනිකායට්ඨකතාවෙහි "පපඤ්ච" යන පදය සඳහා අර්ථ සපයා ඇත්තේ තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ග්‍රහණය කර ගැනීමයි. ''පපඤ්චොති මත්ත පමත්තාකාර භාවෙන පවත්තානං තණ්හා දිට්ඨි මානා එතං අධිවචනං''

මෙහි දී එය මාගේය (එතං මම) යනුවෙන් ගැනීම තණ්හාවයි. ඒ මම වෙමි (එසො හමස්මි) යනුවෙන් ගැනීම මානයයි. ඒ මාගේ ආත්මයයි. (එසො මෙ අත්තා) යනුවෙන් ගැනීම දිට්ඨියයි. මෙසේ සංකල්පිය ලෝකය පිළිබඳ පුද්ගලයා

22 FEB 2016



ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය පදනම් කොටගෙන විපරීත සංඥාවන් නිර්මාණය කරගනු ලබන අතර, ඒ පිළිබඳ ආලයට පත් වේ.

## ආලය සඳහා පදනම

මූලික සූත්‍ර දේශනාවන් විමසුමේ දී ඇලීම සඳහා හේතු කාරකයා ලෙස දැක්වෙන්නේ තෘෂ්ණාවයි. එනම් වේදනාව හෙවත් වින්දනය තුළින් පහළ වන අරමුණු නැවත නැවත ලබාගැනීමේ කැමැත්තයි. මෙම කැමැත්ත හේතුවෙන් මතු සැපත විඳීමේ රුචිය සත්වයා තුළ පහළ වේ. ඔහු මේ පිළිබඳ ඇලීමට පත් වෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා යන ත්‍රිවිධාකාර තෘෂ්ණාවන් ඇති වේ. කාමතණ්හා යනු පස්කම් සැප කෙරෙහි ඇති කැමැත්තයි. භවතණ්හාව යනු පස්කම් සැප ලබාගැනීම සඳහා මතු සසරෙහි ඉපදීමට ඇති කැමැත්තයි. විභවතණ්හාව යනු අන්භවයක් පිළිබඳ නොසිතා මෙම භවයෙහි හැකි උපරිම අයුරින් කම්සැප විඳීමේ කැමැත්තයි.

මෙම තෘෂ්ණාවෙහි ස්වභාව පිළිබඳ විමසීමෙ දී, යම් සේ ගසක් මුලින් සිඳිනු ලදුව, මූල උපද්‍රවයක් නොමැතිව තිබේ නම් එම ගස නැවත නැවත ලියලන්නාක් සේ තෘෂ්ණාවද සහමුලින්ම ඉවත් කරන තුරු නැවත නැවත ලියලන බව දක්වා ඇත. එසේම එය තුළින් සසර තුළ දුක ද නිර්මාණය වේ.

"යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති

එවම්පි තණ්හානුසයෙ අනූහතෙ නිබ්බත්තති දුක්ඛ මිදං පුනප්පුනං"[21]

මෙහිදී විශේෂයෙන් අවබෝධ කොට ගත යුතු කරුණක් වේ. එනම් බාහිර අරමුණු කිසිවක් පුද්ගලයාගේ ඇලීම පිණිස, තෘෂ්ණාව පිණිස ක්‍රියාකාරී නොවන බවයි. පුද්ගලයා බාහිර අරමුණු පිළිබඳ ඇලෙනුයේ ස්වසන්තානගත සංකල්පරාගය පදනම් කොටගෙන ය. සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසීමේ දී බාහිර ලෝකයේ විචිත්‍ර දෑ කාමයෝ නොවන බවත්,

පුද්ගලයා තුළ පවත්නා රාග සංකල්පයම කාමය වන බවත් දක්වා ඇත. එසේම ප්‍රඥාවන්ත පුද්ගලයා ලොව විසිතුරු දෑ පිළිබඳව ඇති ඇල්ම දුරුකරනු ලබයි.

**"න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ - සංකප්පරාගො පුරිසස්ස කාමො**

**තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ - අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං"[22]**

මෙම අදහස තවත් පැහැදිලි ලෙස සංයුක්ත නිකායෙහි විග්‍රහ වේ. "ඇස රූප පිළිබඳ සංයෝජනයක් නොවේ. රූපය ඇස පිළිබඳ සංයෝජනයක් නොවේ. ඒ දෙක පිළිබඳව ඇති වන්නා වූ ඡන්දරාගයම සංයෝජනය වේ. ඇස රූපය පිළිබඳ සංයෝජනයක් නම් මෙම බ්‍රහ්මචරිය වාසය පවත්නේ නොවේ.

**"නඛො චක්ඛු රූපානං සංයොජනං න රූපා චක්ඛු තස්ස.... යඤ්ච තස්ස තදූභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සංයොජනං..."[23]**

එසේම රමණීය වූ, වනඅරන්හි කම්සැප සොයන්නන් සිත් නොඅලවන බවත් වීතරාගීන් එහි සිත් අලවන බවත් දක්වේ.

**"රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමතී ජනො**

**වීතරාගා රමෙස්සන්ති - න තෙ කාම ගවෙසිනො"[24]**

මෙසේ ඇලීම සඳහා පුද්ගල සංකප්පරාගය හේතු වන බව බුදුදහම අවධාරණය කරනු ලබයි. මෙම ඇලීමේ ප්‍රතිඵලය වනුයේ පුද්ගලයා භවගාමී වීමයි. "**උපාදාන පච්චයා භවො**"

මරණින් මතු පුද්ගලයා නැවත භවයකට පත්වීම මේ තුළින් සිදු වේ. මෙහි දී කාමභව උප්පත්තිභව යනුවෙන් භවය දෙවැදෑරුම් වේ. "කාම භව" යනු සසරට යොමු කරන පුඤ්ඤාභි සහ අපුඤ්ඤාභි සංඛාරයන් පදනම් ව නිර්මාණය වන සත්තාවාසයයි. "උප්පත්ති භව" යනු කර්ම භවයෙන් පහළ වන සත්තාවාස 09 කි. එනම්, කාම භව, රූප භව, අරූප භව, විඤ්ඤාණ භව, අසඤ්ඤා භව, නේවසඤ්ඤානාසඤ්ඤා භව,



ඒකවොකාර භව, චතුවෝකාර භව, පඤ්චවෝකාර භව යනු මෙම භව නවයයි. පුද්ගලයා කාම වස්තූන් තුළ දැඩිව ඇලීම නිසා මෙම භවගාමීත්වය සිදු වේ. මෙහි දී ඔහු විසින් සිදු කරනු ලැබූ පුඤ්ඤාභි සංඛාර අපුඤ්ඤාභි සංඛාර පදනම් වේ. උපාදානයට හෙවත් ඇලීමට ප්‍රධාන වශයෙන් උවමනා වනුයේ, එය අපේක්ෂා කරනුයේ භවය ලැබීමයි.

මෙසේ ඇලීම නිසා භවය නිර්මාණය වන බව අවධාරණය කරන බුදු දහම, ඇලීම සඳහා පදනම් වන තෘෂ්ණාව හෙවත් ආශාවත්, ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වයත්නැවතිය යුතු බව දක්වා ඇත. (ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො) මෙයින් අදහස් කරනු ලබන්නේ ඉන්ද්‍රිය තුළින් අරමුණු ගැනීම නතර කිරීම නොව, ඉන්ද්‍රිය තුළින් ලබා ගන්නා වූ අරමුණු පිළිබඳ විපරීත සංඥාවන් ගොඩනැඟීම නැවැත්වීමයි. එනම් ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු ගෙන ඒවා සුඛ - දුක්ඛ වශයෙන් ග්‍රහණය නොකිරීමයි. ඉන්ද්‍රියයන් සංවර කර නොගෙන විහරණය කරන පුද්ගලයා අභිජ්ඣා දෝමනස්ස වශයෙන් විවිධ පවිටු අකුසලයන් බිහිකර ගනියි ද ඒ අරමුණු පිළිබඳ සංවරව පිළිපැදීම මෙයින් අදහස් කරයි.

**"ඉධ මහාරාජ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහි හොති. නානුබ්‍යඤ්ජනග්ගාහි. යත්‍වාධිකරණමෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති"[25]**

මේ සඳහා බුදු දහම ඉන්ද්‍රිය භාවනාව නිර්දේශ කරයි. එනම්,

**"ඉධානන්ද භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජති මනාපං උප්පජ්ජති අමනාපං උප්පජ්ජති මනාපාමනාපං සො එවං පජානාති උප්පන්නං ඛො මෙ ඉදං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං තඤ්ච ඛො සංඛතං ඔළාරිකං පටිච්චසමුප්පන්නං එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛාති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති උපෙක්ඛා සන්ඨාති, සෙය්‍යථාපි ආනන්ද චක්ඛුමා පුරිසො උම්මීලෙත්වා නිම්මීලෙය්‍ය නිම්මීලිත්වා උම්මීලෙය්‍ය එවමෙව ඛො ආනන්ද යස්ස කස්සචි**

එවං සීසං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු.''[26]

ඇසින් රූපයක් දැක මනාප වූ හෝ අමනාප වූ හෝ මානාපාමනාප වූ හෝ සිතුවිල්ලක් උපදින්නේ නම්, තමා තුළ ඒ කෙරෙහි මනාපයක් උපන් බව හෝ අමනාපයක් උපන් බව හෝ මනාපාමනාප සිතක් උපන් බව හෝ දැක එය සංඛතයැයි ද ඖළාරිකයැයි ද ප්‍රතීත්‍යසමුප්පන්න යැයි ද උපේක්ෂාවේ පිහිටීම යහපත් යැයි ද සළකන කල්හි උපන්නා වූ මනාපය ද අමනාපය ද මනාපාමනාපය යන සිත ද ඇසිපිය හෙළන තරම් ක්ෂණික කාලයකදී එතරම් ඉක්මනින් අඩු උත්සාහයකින් නිරුද්ධ වී සිත උපේක්ෂාවෙහි පිහිටයි. ආර්ය විනයෙහි චක්ෂුර් විඥෙය්‍ය රූපයන්හි අනුත්තර වූ ඉන්ද්‍රිය භාවනාව නම් මෙයයි. සියලු ඉන්ද්‍රිය පිළිබඳව මෙසේ ඉන්ද්‍රියභාවනාව සිදු කළ යුතුය.

**යෝගාචාර විඥානවාදී දර්ශනයේ විග්‍රවන ආලය විඥානය.**

මුල් බුදුදහමේ දැක්වෙන "ආලය" හෙවත් ඇලීම පිළිබඳ විග්‍රහය මහායාන බෞද්ධ සම්ප්‍රදායට අයත් යෝගාචාර විඥානවාදී දර්ශනය තුළ ත්‍රිවිධ පරිණාමයක් ඔස්සේ විස්තර කොට ඇත. එනම්, ආලය විඥානය, මනන විඥානය, ප්‍රවෘත්ති විඥානය යන විඥානත්‍රයයි. මෙහිදී සියල්ලට ප්‍රධාන වූ විඥානය ආලය විඥානයයි. එම "ආලය" යන පදය තුළින් ද ඇලීම යන අදහස අර්ථවත් කොට ඇත. සම්භාව්‍ය සංස්කෘත ග්‍රන්ථයන් තුළ "ආලීන" යන පදය දක්නට ඇත. එය "ආ" පූර්ව "ලී" ධාතුවෙන් නිර්මාණය වේ. ඒ තුළ "ඇලුණු" යන අර්ථය අන්තර්ගතව ඇත. මේ සඳහා අර්ථ විවරණය සපයන **"ලැම්බර්ට් ස්මිතොසන්"** එය "උපාදාන" යන්න හා ගැලපෙන බව දක්වයි.[27] මෙම නිසා මූලික සූත්‍රගත ඇලීමේ ක්‍රියාවලියෙහි සංවර්ධනයක් ලෙස මෙම ආලය විඥානය පිළිබඳ අධ්‍යයනය කළ හැකිය.

ආලය විඥානය හැඳින්වීම සඳහා පර්යාය පද රාශියකි. ඒ සියල්ල එහි භාවිතය අනුව යෙදී ඇත. ආචාර්ය වසුබන්ධු,



ආචාර්ය ස්ථිරමති යන ආචාර්යවරු ආලය විඥානය හැඳින්වීම සඳහා "සර්වබීජක" යන පදය යොදා ඇත.[28] සර්වබීජක ලෙස හඳුන්වන්නේ සියලු කර්මබීජ, ක්ලේෂබීජ, ස්මෘතිබීජ තැන්පත්ව පවතින බැවිනි. මෙම බීජයන් පදනම් කොට ගෙන ආලය විඥානයාගේ පැවැත්ම සිදුවන අතර, උක්ත බීජයෝ ද මෙම ආලය විඥානයේ ක්‍රියාකාරිත්වය මත රඳා පවතියි. මෙහි දී මෙම බීජ යනු කුමක්දැයි තේරුම් ගත යුතුය. සත්වයා විෂයෙහි ඒ ඒ ධර්මයන් පිළිබඳව නොයෙකුත් ආකල්ප නිර්මාණය කිරීමේ ශක්තිය මෙම "බීජ" ලෙස දැක්වේ. ඒ තුළින් පුද්ගලයා බාහිර විෂය වස්තු කෙරෙහි ඇලීමට යොමු වෙයි. ඒවා කර්මබීජ, ක්ලේෂබීජ, ස්මෘතිබීජ වශයෙන් ත්‍රයාකාර වන අතර, මේ සඳහා ඉන්ද්‍රිය ශක්තිය ද මූලික වන බව යෝගාචාර මතයයි.

ආචාර්ය අසංගපාදයෝ ආලය විඥානය "ආදාන විඥානය" ලෙස ද දැක්වේ. මෙහිදී ගෙයක ස්වරූපයෙන් ආලය විඥානය විග්‍රහ කොට ඇත. වස්තු රැස් කරන ස්ථානය ගෘහයයි. සියලු වාසනාවන් රැස් කරන බැවින් ආලය විඥානය ද ගෘහයක් මෙනි. යම් අවස්ථාවක විඥානයක් උපදී ද ආලය විඥානය තුළ එයට අනුරූපී වාසනාවන් අත්හරී. ඒවා ආලයෙහි තැන්පත් වීම ද වේ. යම් සේ ජල ප්‍රවාහයක් තණ, දර, ගොම ආදියද ගෙන ගලා යන ස්වභාවයක් වේ ද ඒ අයුරින් ආලය විඥානය ද කුසල, අකුසල, අනෙඤ්ජ සංඛාරවලින් අනුගතව ප්‍රවාහරූපී වේ. මේ අනුව වාසනාවන්ගේ සංග්‍රහ ස්ථානය වීම නිසා එය ආලය නැතහොත් ගෘහය ලෙස දක්වා ඇත.

**"ලීයන්තෙ උපනිබධ්‍යන්තෙ අස්මින් සර්ව ධර්මාඃ කාර්යභාවෙන"[29]**

එසේ ම මෙම ආලය විඥානය පිළිබඳ කෙටි හැඳින්වීමක් සපයන හේන්පිටගෙදර ඥානසීහ හිමියෝ මෙසේ දක්වති. ''සත්වයාගේ පැවැත්මෙහි මූලික වගකීම දරන්නේ මේ ආලය විඥානයයි. දීර්ඝ කාලයක සිට සත්වයා විසින් සසර තුළ රැස් කරන ලද කුසල අකුසල කර්මයන් දරා සිටින්නා ද මෙම ආලය විඥානයයි. නැති ලෝකයක් ඇති ලෙස විකෘති අවබෝධයන්

ලබා දෙන්නේ ද මෙම ආලය විඥානයයි. ආලය විඥානය තුළ රැඳී ඇති කර්ම බීජයන් නිසා මෙම විඥානයෙහි පැවැත්ම සිදුවන අතර, ආලය විඥානය නිසා කර්ම බීජ ආරක්‍ෂා වෙයි. ආලය විඥානය, කර්ම හා බීජ දෙක සමඟ අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව පවතී. එසේම මෙය ද එකම සිතක් නොවේ. ගලන දිය පහරක විච්ඡේදයක් දැකිය නොහැකි ලෙස ඇතිවෙමින් ද නැතිවෙමින් ද අර්හත්වය දක්වා ගමන් කරයි.[30]

මෙම විග්‍රහයට අනුව දිය පහරක් සේ ආලය විඥානය අර්හත්වය දක්වා සසර තුළ ක්‍රියාත්මක වන අතර, පුද්ගලයා රැස් කරනු ලබන සියලු ක්ලේෂයෝ බීජ වශයෙන් මෙහි තැන්පත්ව සසර තුළ බලපවත්වන බව දක්වා ඇත.

මෙහිදී ආලය විඥානයෙහි ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රවෘත්ති සහ මනන යන විඥානයන්හි ක්‍රියාකාරීත්වය ද බලපායි. ආලම්භන විඥානය හෙවත් ෂඩ් ඉන්ද්‍රියයන්ගේ මෙහෙයවීමෙන් සත්වැනි මනන විඥානය නිර්මාණය වේ. මෙම මනන විඥානයට සාපේක්‍ෂව ආලය විඥානය පහල වන බව යෝගාචාරීන් දක්වයි.

යෝගාචාර සම්ප්‍රදාය තුළ දැක්වෙන ප්‍රවෘත්ති විඥානය මූලික බුදුසමයේ ඉන්ද්‍රිය ඥානයට සමාන වූවකි. එනම් ඉන්ද්‍රිය මඟින් බාහිර අරමුණු ලබාගැනීමයි. මෙම විඥානයන් සඳහා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම යන බාහ්‍යාර්ථයෝ පිළිවෙලින් අවභාසයෝ වෙති. යෝගාචාර සම්ප්‍රදායට අනුව මෙම විඥානයන් අව්‍යාකෘත වේ. එසේම ස්වර්ත්‍රග, විනියත, කුශල, ක්ලේෂ, උපක්ලේෂ හා ත්‍රිවිධ වේදනාවන්ගෙන් ද යුක්තය.

"සර්වත්‍රගෛර් විනියතෛඃ - කුශලෛශ් චෛතසෛ රසෞ
සම්ප්‍රයුක්තා තථා ක්ලෙශෛ - රූපක්ලෙශෛස් ත්‍රිවෙදනා"[31]

මෙසේ ප්‍රවෘත්ති විඥානය තුළින් ලබන්නා වූ විඥානය මූලික සූත්‍රාගත විවරණයන් මෙන්ම නිර්විකල්පිත වූ තත්වයක් වන අතර, මෙයින් පසු එය ක්‍රමයෙන් විකල්පිත තත්වයක් වෙත ගමන් කරයි. මෙම ප්‍රවෘත්ති විඥානය අනතුරුව මනන විඥානය



තුළ ක්‍රියාත්මක වේ. මනන විඥානය ප්‍රවෘත්ති විඥානයත් ආලය විඥානයත් අතර මැදි වූ විඥාන අවස්ථාවකි. මනනාත්මක වීම නිසා මෙයට මනන විඥානය යැයි භාවිත කරයි. "තදාලම්බං මනො නාම විඥානම් මනනාත්මකම්"[32] අප තුළ ඇති "මම" යන හැඟීම තහවුරු වී ඇත්තේ මෙම මනන විඥානය තුළය. මනන විඥානය, ආලය විඥානය ආශ්‍රය කොට ගෙන පවතියි. එසේම ආලය විඥානය ඇතුලු සියලු සිත්වල යෙදෙන සබ්බචිත්තසාධාරණ චෛතසිකයන් වූ ස්පර්ශ, මනසිකාර, වේදනා, සංඥා, චේතනා යන චෛතසිකයන් 5 ක් ද මෙම මනන විඥානය තුළ ඇතුළත් වන බව යෝගාචාර සම්ප්‍රදායේ ඉගැන්වීම යි. මීට අමතරව ආත්ම දෘෂ්ඨි, ආත්ම මාන, ආත්ම ස්නේහ, ආත්ම සංඥා යන චතුර්විධ ක්ලේෂයන් නිරන්තරයෙන් මෙම මනන විඥානය තුළ අන්තර්ගත වේ.

"ක්ලෙශෛශ් චතුර්භිඃ සහිතං - නිවෘතාව්‍යාකෘතෛඃ සදා
ආත්මදෘෂ්ට්‍යාත්මමොහොත්ම - මානාත්මස්නෙහසංඥිතෛඃ"[33]

ප්‍රවෘත්ති විඥානය තුළින් ලබන්නා වූ විඥානය ආත්මීය වශයෙන් පුද්ගලයා ග්‍රහණය කරගනු ලබන්නේ මෙම මනන විඥානය තුළ ඇති ඉහත දැක්වූ ක්ලේෂයන් පදනම් කොටගෙන ය. "ක්ලිෂ්ඨමනෝවිඥානය" ලෙස දැක්වෙන්නේ ද මෙම මනන විඥානයයි. මෙසේ ප්‍රවෘත්ති විඥානය මනන විඥානය තුළින් ආත්මීය තත්වයකට පත්වන අතර, මේ සඳහා බලපාන්නේ ආලය විඥානයාගේ ක්‍රියාකාරීත්වයයි. ආලය විඥානය තුළ රැඳී ඇති ක්ලේෂ බීජයෝ මෙහිදී බලපානු ලබයි. එසේම මෙහිදී ආලය විඥානය නැවත ද ක්ලේෂ බීජයෝ තැන්පත් කරගනු ලබයි. ආලය විඥානයට මනන විඥානයේ ක්‍රියාකාරීත්වයෙන් තොරව ක්ලේෂ බීජ තැන්පත් කොටගත නොහැක. මනන විඥානය මෙහි දී දොරටුවක් සේ ක්‍රියාත්මක වේ. ආර්යලංකාවතාර සූත්‍රයේ "විෂය පරිච්ඡේද අභිනිවේශන ප්‍රවර්තමානං වාසනාභිර් ආලය විඥානං ප්‍රපුෂ්ණාති" යනුවෙන් දැක්වෙන්නේ මෙම ආලය විඥානයාගේ පෝෂණය මනන විඥානය තුළින් සිදු වන බවයි. මෙසේ ප්‍රවෘත්ති විඥානය මඟින් ගෙන එනු ලබන ආරම්මණයන්හි ස්වභාවය විමසා බැලීම,

නිර්ණය කිරීම, මෙනෙහි කිරීම, මෙම මනන විඥානය තුළින් සිදු වේ. පුද්ගලයා ආරම්මණයක් විෂයෙහි ඇලීමට පත්වනුයේ ආලය විඥානය තුළ ඇති බීජයෝ මනන විඥානය තුළින් ක්‍රියාත්මක වීම තුළ බව පැහැදිලිය.

ආලය විඥානය තුළ ද ස්පර්ශ, මනසිකාර, වේදනා, සංඥා චේතනා යන චෛතසිකයන් අන්තර්ගතය.[34] ස්පර්ශය යනු ඉන්ද්‍රිය, විෂය, විඥානය යන තිදෙනාගේ එකතුවයි. මෙය "ත්‍රිකසන්නිපාත" යනුවෙන් ද දක්වයි. ස්පර්ශය වේදනාව ඇසුරු නොකරයි. ඒ තුළින් ස්පර්ශය, වස්තුව පිළිබඳ මනෝඥ හා අමනෝඥ ලෙස නිමිති ගනියි. "මනස්කාර" යනු මෙනෙහි කිරීමයි. මේ තුළින් සිත චෛතසිකයන් කරා යොමු කරවීම සිදු කරනු ලබයි. එසේම ආලම්භනය අනුභව කිරීම වේදනාව නම් වේ. එය මිහිරි, නොමිහිරි, මැදිහත් වශයෙන් විඥානවාදී දර්ශනය තුළ ත්‍රයාකාරව දක්වයි. එසේම වේදනාව විෂයවේදනා, ස්වභාවවේදනා වශයෙන් කොටස් දෙකක් ද ඇතැම් මූලාශ්‍රය තුළ හමු වේ. විෂය වේදනාව ඉහතින් දක්වන ලද අරමුණු විඳීමෙන් පහළ වන වේදනාවයි. ස්වභාව වේදනාව යනු අරමුණු ස්පර්ශ කළ මොහොතේ ක්ෂණිකව වැටහෙන වේදනාවයි. එය යමක් ස්පර්ශ වූ බව සිතට දැනුම් දෙයි. සංඥාව නම් නිමිති ගැනීමයි. චේතනාව යනු සිත ක්‍රියාවෙහි යෙදවීමයි. කුශල වූ හෝ අකුශල වූ චෛතසිකයන් ඒ ඒ කර්මයන්හි මේ චේතනාව මඟින් යොදවනු ලබයි. මෙම සියලු චෛතසිකයෝ ද ආලය විඥානය මෙන්ම අනිවෘත හා අව්‍යාකෘත වෙයි.

මෙම ආලය විඥානය හැඳින්වීම සඳහා ආර්යලංකාවතාර සූත්‍රයේ "තථාගතගර්භ" යන්න යොදා ඇත. මෙය තුළින් තථාගතබව ලබාගැනීමට ඇති ගර්භය යන අදහස ද අවිච්ඡින්නව පැමිණි ගර්භය යන අදහස ද ගෙනදෙයි. පුද්ගලයා සිදු කරනු ලබන කුසල - අකුසල කර්මයන් සසර පුරාවට රැගෙන යනු ලබන්නේ මෙම තථාගතගර්භය තුළිනි. ආර්ය ලංකාවතාර සූත්‍රයෙහි මෙය සසර තුළ ආත්මීය ස්වභාවයෙන් තොරව නළුවෙකු මෙන් ගමන් කරන බව දක්වා ඇත.



"භගවාංස්යෙතදබෝචත් තථාගතගර්භො මහාමතෙ
කුශලාකුශලහේතුකඃ
සර්වජන්මගතිකර්තා ප්‍රවර්තතෙ නටවද්ගතිසංකට
ආත්මාත්මීයවර්ජිකා ක්ෂණිකපරිවර්තො නාම ෂෂ්ඨඃ"[35]

භවයෙහි කවර අවස්ථාවකදී හෝ කරන ලද සෑම කර්මයක ප්‍රතිඵල ආලය විඥානයෙහි තැන්පත් වේ. එය එබැවින් "විපාක විඥානය" නමින් ද හැඳින්වේ. මෙහිදී ආලය විඥානය තුළ ද්විත්ව ක්‍රියාකාරීත්වයක් දක්නට ඇත. එනම්, අතීත කර්මන්ගේ ඵල ශක්තිය තැන්පත් කරගන්නා අතරම, වාසනා ශක්තිය තුළින් අනාගත විඥානයන්ගේ ඉපදීම නිර්මාණය කිරීමයි. මෙය චක්‍රාකාරව පවතී. මෙහිදී කර්ම බීජ ආලය විඥානයේ තැන්පත් වීම හේතුපරිණාමය වන අතර, ඒවා ආලය විඥානයේ විද්‍යමානත්වය හා පරිණාමය වේ. මෙසේ ආලය විඥානය අනවතර වශයෙන් පරිණාමයට පත් වේ. එය සසර තුළ සැඩ දිය පහරක් මෙන් ගලා බසී. එහි ව්‍යාවෘත්තිය හෙවත් නිරෝධය රහත් භාවයයි.[36] රහත් බව ලැබීමෙන් ආලයෙහි පිහිටි සියලු දෞෂ්ඨුල්‍ය හෙවත් ක්ලේෂ ධර්මයෝ කිසිවක් ඉතිරි නොවී ප්‍රහානය වේ. මෙයින් ආලය විඥානය "විමල විඥානය" බවට පත් වේ. මෙය ආලය විඥානයාගේ ව්‍යාවෘතියයි.

මෙසේ ප්‍රවෘත්ති විඥානය මඟින් ඉන්ද්‍රියසන්නිකර්ෂණය සිදු කරනු ලබන අතර, එය මනන විඥානය මඟින් ආත්මීය වශයෙන් ගෙන ක්ලේෂ ධර්ම නිර්මාණය කරනු ලබයි. ඒ සඳහා පදනම් වන්නේ ආලය විඥානය තුළ තැන්පත්ව ඇති ක්ලේෂ බීජයෝය. මෙම නිසා ආලය විඥානය බාහිර වස්තු විෂයෙහි ඇලීම තුළ ප්‍රධාන ග්‍රාහකයා ලෙස සැලකිය හැකිය.

## නිගමනය

මුල් බුදුසමය තුළ ඇලීමේ ක්‍රියාවලිය සිදුවන්නේ වෛඥානික ක්‍රියාවලියක් තුළ ය. යෝගාචාර දර්ශනයේ ද එය සිදුවන්නේ වෛඥානික ක්‍රියාවලියක් තුළය. මෙම ක්‍රියාවලි දෙක පිළිබඳ අධ්‍යයනයේ දී මුල් බුදුසමය හා යෝගාචාර විඥානවාදී

දර්ශනය උක්තකාරණාව විෂයෙහි යම් සමානත්වයක් දක්වන බව පෙනී යන අතර, යෝගාචාර දර්ශනයේ ආලය විඥානය තුළින් එය තවදුරටත් සංවර්ධනය කොට ඇති ආකාරයක් පෙනේ.

## ආන්තික සටහන්

1 ම.නි. i අරියපරියෙසන සූත්‍රය, බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, 408-409 පිටු.

2. සං.නි. I ආයාචනා සූත්‍රය, බු.ජ.මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, 248-249 පිටු.

3. ම.නි. චූලසීහනාද සූත්‍රය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, 158-159 පිටු.

4. සං.නි. iv ධම්මචක්කපවත්තනන සූත්‍රය, බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, 270-271 පිටු.

5. ම.නි. i සම්මාදිට්ඨි සූත්‍රය, බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, 114-115 පිටු.

6. සං.නි. iv අනාලය සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, 114-115 පිටු.

7. Wooard f.l. (සංයුක්ත නිකායට්ඨකතාව සංස්.) 1 වෙළුම. 195-196 පිටු.

8. Wallser. M.yd Kopp.H. මනෝරථපූරණිය (අංගුත්තර නිකායට්ඨකතා සංස්) 111 වෙළුම 12 පිටුව.

9. දී.නි. i බ්‍රහ්මජාල සූත්‍රය, බු.ජ.මු. 9 ශ්‍රී ලංකා ජනරජය 280 පිටුව.

10. දී.නි. සීලක්ඛන්ධටීකා, බ්‍රහ්මජාල සුත්තවණ්ණනා, s.c.cd

11. සං.නි. iii සමනුපස්සනා සූත්‍රය, බු.ජ.මු. 82 පිටුව.

12. සං.නි. සළායතන වග්ගය, අබ්‍යාකත සංයුක්තය.

13. එම.

14. ම.නි. i මධුපිණ්ඩික සූත්‍රය, බු.ජ.මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, 460 පිටුව.

15. ම.නි. i මහාතණ්හාසංඛය සූත්‍රය, බු.ජ.මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල 2005, 460 පිටුව.

16. එම.

17. සං.නි. iv නිබ්බෙධික සූත්‍රය, බු.ජ.මු. 208 පිටුව.



18. සං.නි. iv රහොගත සූත්‍රය, බු.ජ.මු. 410 පිටුව.

19. සු.නි. තුවටක සූත්‍රය, බු.ජ.මු. 920 ගාථාව.

20. ම.නි.i විතක්කසන්ථාන සූත්‍රය, බු.ජ.මු. 300 පිටුව.

21. බු.නි. ධම්මපදය, තණ්හා වග්ගය, 05 ගාථාව.

22. සං.නි. i 30 පිටුව.

23. සං.නි. iv. 163 පිටුව.

24. ධම්මපදය, 99 ගාථාව.

25. දී.නි. i සාමඤ්ඤඵල සූත්‍රය, බු.ජ.මු. 122 පිටුව.

26. ම.නි. i ඉන්ද්‍රියභාවනා සූත්‍රය, බු.ජ.මු. 618 පිටුව.

27. Schmithausan, Lambert, Alayavijñnana P. 28

28. විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා 02 ශ්ලෝකය.

29 එම.

30. ඥාණසීහ හිමි, හේන්පිටගෙදර, ශූන්‍යතා දර්ශනය, 73 පිටුව.

31. විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා 09 ශ්ලෝකය.

32. එම, එම 06 ශ්ලෝකය.

33. එම, එම, 06 ශ්ලෝකය.

34. එම, එම, 03 ශ්ලෝකය

35. ආර්යලංකාවතාරය සූත්‍රය.

36. විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා 05 ශ්ලෝකය.